**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 30 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් මස 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් රු.413,757 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ලංකා බැංකුවේ බැංකු ගිණුමට අදාල හඳුනා නොගත් රු.206,609 ක් ලෙජර් ගිණුමේ හරට සටහන් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.8,979,370 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ලෙජරයේ සමුච්චිත අරමුදල් ගිණුමේ රු.262,883 ක හඳුනා නොගත් වටිනාකමක් බැරට සටහන් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හිඟ හිටි කර්මාන්ත ණයගැතියන් ලෙස රු.804,279 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව කර්මාන්ත ණයහිමි ලෙස රු.1,006,864 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ඉකුත් වර්ෂයට අදාල සමාලෝචිත වර්ෂයේ දී ලද උසාවි දඩ ආදායම වූ රු.147,513 ක් සහ මුද්දර ගාස්තු ආදායම රු.352,595 ක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.775,406 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ලෙජරයේ ප්‍රාග්ධන ආධාර හා වෙනත් ආදායම් ගිණුම්වල එකතුව රු.56,926 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ආදායමට ගෙන නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී සභාවට ලැබී තිබූ රු.1,000,000 ක ප්‍රාග්ධන ආධාර මුදල ආදායමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාල අක්කර බදු සහ ව්‍යාපාර බදු රු.180,210 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල සඳහා ගෙවිය යුතු රු.778,849 ක් අඩුවෙන් ප්‍රතිපාදන දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයට අදාලව විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 2,192,185 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර දක්නට ලැබුණු වෙනස්කම්වල එකතුව රු. 1,943,748 ක් විය.

1.3.3 **අවිනිශ්චිත ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අවිනිශ්චිත ගිණුමේ රු.385,534 ක බැර ශේෂයක් දක්වා තිබුණි.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.13,651,027 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.6,845,899 ක් විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

රු. 96,784,514 ක් වටිනා ගිණුම් විෂයයන් 07 ක්, පැවරුම් නියෝග හෝ ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, නිරවුල් කරන ලද ආකාරය සඳහා සාක්ෂි, ලෙජර් ගිණුම් හා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 132 වගන්තිය | පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව සභා අනුමැතියකින් තොරව මූල්‍යමය හා ද්‍රව්‍යාධාර ලෙස අවස්ථා 05 කදී රු.142,096 ක මුදලක් වැයකර තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) රීති 217 | සභාව සතු සියලුම ඉඩම් හාගොඩනැගිලි පිළිබඳව පී.එස්.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

(ii) රීති 218 — පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය සඳහා පරීක්ෂා කර නොතිබුණි.

(ඈ) 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත — පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 11 ක් වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත — සභාවේ සේවයේ නියුතු රු.25,000 ක් ඉක්ම වූ දළ පාරිශ්‍රමිකයක් ලැබූ නිලධාරීන් 505 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.12,625 ක් වූ මුද්දර බදු වටිනාකම වැටුපෙන් අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි

-----------------------------------

(i) මු.රෙ. 371 — සභාව විසින් අවස්ථා 15 කදී ගෙවන ලද රු.656,300 ක් වූ අත්තිකාරම් 2016 අගෝස්තු වන විටත් පියවා නොතිබුණි.

(ii) මු. රෙ. 571 — තැන්පත් කර වර්ෂ 02 ක් ඉක්මවන ලද රු.306,605 ක් වටිනා තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය — පරිගණක උපාංග පිළිබඳ සවිස්තර තොරතුරු ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

### 1.3.7 අවිධිමත් ගනුදෙනු

--------------------

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2014 නොවැම්බර් 12 දිනැති අංක EST-4/PEMNT/03/0225 දරන චක්‍රලේඛයේ 07 වන වගන්තියට පටහැනිව 2015 නොවැම්බර් 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදේශක ක්ෂේත්‍ර කම්කරුවෙකු සඳහා පත්වීමක් ලබාදී 2015 නොවැම්බර් සහ දෙසැම්බර් මාස දෙකට අදාලව රු.22,134 ක දළ වැටුපක් සභා අරමුදලෙන් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,338,210 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.914,202 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

2015 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.805,528 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායමෙන් 57.3% (රු.2,693,909) ක් හිඟ හිටිව තිබුණි.

2.2.2 **කඩ කුලී**

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සභාව සතු කඩ කාමර 22 ක් සඳහා නව තක්සේරු කුලිය අය නොකර පැරණි තක්සේරු කුලියම අයකර තිබීම හේතුවෙන් 2014 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා මාසිකව රු.51,525 බැගින් රු.1,236,600 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,152,208 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,339,799 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කොන්ත්‍රාත් පාලනය**

2014 වර්ෂයේ දී ගිවිසුම් අත්සන් කරන ලද කර්මාන්ත 05 ක් 2016 අගෝස්තු 08 වන විටද වැඩ නිමකර නොතිබූ අතර, එම කර්මාන්ත සඳහා ලබාදෙන ලද රු.494,051 ක අත්තිකාරම් මුදල් පියවා ගැනීමටද සභාව කටයුතු කර නොතිබුණි.

3.2 **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

1980 අංක 47 දරන පාරිසරික පනතට අනුව කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා සභාවේ අරමුණුවලට අනුව කටයුතු කළයුතු වුවත්, බදුල්ල පාරේ 13 කණුව යන ස්ථානය අසල නිරාවරණ ප්‍රදේශයක කසල ගොඩගැසීම හේතුවෙන් අවට ප්‍රදේශයේ පාරිසරික ගැටලු පැවතිණ.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ ඡේද 4:2 අනුව සෑම ආයතනයක්ම වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර භාවිතා කළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාව ප්‍රවර්තන වර්ෂයේ දී එසේ කර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**
---------------------------------------------------------
සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කොට නොතිබුණි.

4.4 **වත්කම් කළමනාකරණය**
----------------------------
(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**
------------------------------------------
(i) ප්‍රාදේශීය සතු අත් ට්‍රැක්ටරයක් නිශ්කාර්යව සහා භූමියේ ගාල්කර තිබුණි.

(ii) රුපියල් 533,100 ක් වැයකර ඉදිකර තිබූ ඩොලමයිට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා වූ ගොඩනැගිල්ලක් වසර 11 ක කාලයක් මුළුල්ලේ නිශ්කාර්යව පැවතිණි.

5. **පද්ධති හා පාලන**
-------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ණයගැති සහ ණයහිමි පාලනය
(ඉ) ගබඩා පාලනය
(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය